**ඇල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) සමාලෝචිත වර්ෂය තුලදී, ඉකුත් කාලපරිච්ඡේද වෙනුවෙන් ගෙවූ දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය පොලී රු.558,000 ක් ණයහිමි ගිණුම හර කළ යුතු වුවද, ණය ගිණුම හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.558,000 ක් අඩුවෙන් ද, ණයහිමි ශේෂය රු.558,000 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වා තිබූ ලෙජර් ගිණුම් අනුව 2014 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.4,092,952 ක් වුවද එය රු.3,517,686 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී කර්මාන්ත සඳහා ලබාදෙන ලද අත්තිකාරම් රු.487,221 ක්, වර්ෂය අවසාන වන විට පියවා තිබූ නමුත්, නොපියවූ අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම රු.487,221 ක් අඩුවෙන් ද, නොපියවූ අත්තිකාරම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සිදුකළ කර්මාන්ත අවසාන ගෙවීම් රු.1,471,933 ක් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ කර්මාන්ත වියදම රු.1,471,933 ක් අඩුවෙන්ද, අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී නව සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දරන ලද රු.2,074,008 ක වියදම, පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ පුනරාවර්තන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සභාවේ පවත්වාගෙන යන ලේඛණවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හා පොල බදු හිඟ ආදායම රු.824,885 ක් වුවද, එය රු.228,308 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා, ආදායම් ණයගැතියන් රු.596,577 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන්ගේ වැටුපෙන් අයකරන ලද සේවක ණය රු.76,529 ක්, සේවක ණය ගිණුමට බැර කළ යුතු වුවද අත්තිකාරම් පියවීමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සේවක ණය ගිණුමේ ශේෂය රු.76,529 ක් වැඩියෙන් ද, අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2013 උපමාන පාදක සංවර්ධන යෝජනා සඳහා සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු රු.29,700 ක්, කර්මාන්ත ණයගැති ගිණුම බැර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුම බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.29,700 ක් වැඩියෙන් ද, අත්තිකාරම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල සිදුකරන ලද වටිනාකම රු.32,532 ක් වූ අත්තිකාරම් පියවීම්, ලබාදුන් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම නිසා අත්තිකාරම් ශේෂය රු.32,532 ක් වැඩියෙන් ද, වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට ලැබී තිබුණු බහුකාර්ය ජංගම කුටි 05 ක වටිනාකම වූ රු.132,500 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂය අවසානයට වත්කම් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.132,500 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් හා උපයෝගී ලේඛණවල ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 22,746,604 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.19,759.068 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.23,868,012 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක් සඳහා විස්තරාත්මක උපලේඛණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ශේෂ සනාථ සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා හා 2013 දෙසැම්බර් 06 දිනැති අංක 1840 දරන ගැසට් නිවේදනය | පනතේ විධිවිධාන ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුල පවත්වා තිබුණු ව්‍යාපාර 12 ක පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලසීමාව ඉක්මවා ගොස් තිබුනද අලුතින් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2013 මැයි 06 දිනැති අංක 12/ආ/6/03/(අ-ඉන්ධන) ලිපිය | අනුමත සීමාව ඉක්මවා ඩීසල් ලීටර් 378.7 ක් සඳහා රු.45,225 ක් වැයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,709,589 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.145,807 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,855,396 ක වාසිදායක විචලනයක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවති ගල්වල බදුදීම් හා කඩ කුලී හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

### 2.2.2 බදු කුලී

---

සභාව සතු කඩ කාමර 10 ක බදුකරුවන් විසින් බදු කුලී ගෙවීම පැහැර හැර තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

සභාව විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.5,889,862 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් අයවිය යුතුව පැවතුණි.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 986,114 |
| මුද්දර ගාස්තු | 4,903,748 |
| | 5,889,862 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

(අ) සභාව සතු දෙමෝදර ගල්වල 2004 වර්ෂය සඳහා බදුගත් බදුකරුගෙන් අයවිය යුතු රු.348,810 ක හිඟ බදු කුලී අයකර ගැනීමට අදාල කාලය තුල අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ස්ථාපනය කර ඇති දුරකථන සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3.2 **හඳුනාගත් අලාභ**

**------------------**

සභාව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙන් ලබාගත් සේවය වෙනුවෙන් නියමිත කාලය තුල ගෙවීම් නොකිරීම නිසා රු.65,861 ක දඩ මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

4. **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ඇයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය